**ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ("විශ්ව විද්‍යාලය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්ව විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විශ්ව විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්ව විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්ව විද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්ව විද්‍යාලය විසින් ණය ගැති සහ ණය හිමි උප ලෙජර පවත්වා නොතිබුණු අතර ප්‍රධාන ලෙජරය තුළ පාලන ගිණුමක් පමණක් පවත්වාගෙන ගොස් තිබුණි. තවද මෙම ගිණුමද ප්‍රමාණවත් විස්තර නොමැතිව අක්‍රමවත් ලෙස පවත්වාගෙන තිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | දැනට ගිණුම්කරණ මෘදුකාංගයක් නොමැතිව ලෙජර් පොත් පවත්වාගෙන යනු ලබන බැවින් එක් එක් ණයහිමියන් සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු නොලැබේ. එමෙන්ම ලෙජරයේ සියළු දත්ත ඇතුළත් කල නොහැකි බැවින් සීමිත දත්ත ප්‍රමාණයක් පමණක් ඇතුළත් කරනු ලැබේ. කෙසේ වෙතත්, එක් එක් ණයහිමියන් පිළිබඳ විස්තර අදාල ගෙවීම් වව්චරයේ ඇතුළත් කරනු ලැබේ. | විධිමත් පරිදි පොත්පත්/ පරිගණක දත්ත පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්වයං මූලා අරමුදල සඳහා පවත්වාගෙන යන ණය හිමි පාලන ගිණුම තුළ රු.418,362 ක් වූ හර කිරීම් අවස්ථා දෙකකට අදාලව හා එකතුව රු.7,369,467 ක්වූ බැර කිරීම් අවස්ථා පහකට අදාලව කිසිදු තොරතුරක් ලෙජරයෙහි සඳහන් නොවුණු බැවින් ඒ පිලිබඳව විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂාවන් සිදුකළ නොහැකි විය. | මෙම ගණුදෙනු වලට අදාල යොමුව අතපසුවීමකින් ලෙජරයේ සටහන් කර නොමැති අතර, ණයහිමි පාලන ගිණුමට ඇතුළත් කර පසුව 2020.01.13 දින සහ 2020.06.30 දින ගෙවීම් සිදු කර නිරවුල් කර ඇති ණයහිමියන් දෙදෙනෙක් මෙලෙස ලෙජරයෙහි හර කිරීම් දෙකක් ලෙස සටහන් කර ඇත. | විධිමත් පරිදි ගිණුම් වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ජ'නල් සටහන් ලෙජර් ගිණුම් වල පිටපත් කිරීමට පෙර පොදු ජ'නලයක සටහන් කළයුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් එවැනි පොදු ජ'නලයක් පවත්වාගෙන ගොස් නොතිබුණු බව නිරීක්ෂණය වීය. | දැනට මැනුවල් (Manual) ක්‍රමයට ලෙජර් පොත් පවත්වා ගෙන යන බැවින් පොදු ලෙජරයක් පවත්වාගෙන නොයන නමුත් එක් එක් ලෙජරය සඳහා වෙන වෙනම අනු අංක පිළිවෙලට ජර්නල් සටහන් කරනු ලැබේ. | විධිමත් පරිදි පොදු ජර්නලයක් පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| (ඈ) | විශ්ව විද්‍යාලය විසින් ආනයන කාර්යයන් ආශ්‍රිත විවිධ ණය හිමියන් සමග ගණුදෙනු පවත්වා තිබුණු අතර එක් එක් ණයහිමියන් සඳහා ණයහිමි ලෙජරයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. එබැවින් මෙම එක් එක් ආනයන ණයහිමියන් සමග සිදුකරනු ලබන ගනුදෙනු සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කල නොහැකිවිය. ආනයන ණය හිමියන්ගේ ශේෂ දැක්වෙන උප ලේඛණයක් විගණනයට ඉදිරිපත් කලද එකතුව රු. 403,738,540 ක් වූ ණයහිමියන් 17 දෙනෙකු නිශ්චිතව හඳුනාගත නොහැකි විය. | දැනට ගිණුම්කරණ පැකේජයක් නොමැතිව මැනුවල් (Manual) ක්‍රමයට ලෙජර් පොත් පවත්වාගෙන යනු ලබන බැවින් එක් එක් ආනයන ණයහිමියන් සඳහා වෙන වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු නොලැබේ. කෙසේ වෙතත් ලෙජරයේ දැක්වෙන ආනයන ණයහිමි පාලන ගිණුම සඳහා උපලේඛණයක් පවත්වාගෙන යනු ලැබේ. එහි ණයවර ලිපි අංකය සඳහන් කර ඇත. සෑම ණයවර ලිපියක් සඳහාම ලිපි ගොණු ගිණුම් අංශයේ පවත්වා ගෙන යනු ලබන අතර මේවාට අදාළ ප්‍රධාන ලිපිගොණු විශ්වවිද්‍යාල රෝහල මගින් පවත්වා ගෙන යනු ලැබේ. | ණයහිමියන් සම්බන්ධ ලිපිගොණු වලට අමතරව ණයහිමි ලෙජරයක් පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ආනයන ණය හිමි පාලන ගිණුමෙහි ගනුදෙනු දින පිළිවෙලට සටහන් නොකළ අවස්ථා නිරීක්ෂණය විය. | විවිධ විදේශ මුදලින් විවෘත කරන ණයවර ලිපි සඳහා ගෙවීම් කිරීම ඇමරිකානු ඩොලර් මගින් සිදු වන බැවින් ආනයන ණයහිමියාට ගෙවූ වටිනාකම සහ බැංකු ගාස්තු වෙන් වශයෙන් දැක්වෙන බැංකු නිවේදනය ලැබීමේ ප්‍රමාදය නිසා ගනුදෙනු දින පිළිවෙලට සටහන් කිරීමට නොහැකි වී ඇත. | විධිමත් පරිදි පොත්පත් පවත්වාගෙන යායුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | උපචිත වියදම් සටහන් කිරීම සඳහා ලෙජරයෙහි වෙන වෙනම ගිණුම් පවත්වා නොතිබුණු අතර විශ්ව විද්‍යාලය හා එහි අනුබද්ධිත අංශයන්හි වියදම් විෂයයන් 92 කට අදාල එකතුව රු. 298,768,392 ක්වූ උපචිත වියදම, ඒ ඒ අංශ වෙනුවෙන් වූ පාලන ගිණුම් 6 ක් මගින් ගිණුම්ගතකර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ඒ ඒ වියදම් විෂයය යටතේ පැවති උපචිත වියදම සතුටුදායක ලෙස පරීක්ෂාකළ නොහැකි විය. | ගිණුම්කරණ පැකේජයක් නොමැතිව ලෙජර් ගිණුම් පවත්වා ගෙන යනු ලබන බැවින් උපචිත වියදම් සඳහා ලෙජර ගිණුම් පවත්වා නොමැති අතර ඒ සඳහා උපලේඛණ පවත්වාගෙන යනු ලැබේ. ලෙජරයෙහි නිවැරදි උපචිත වියදම් වටිනාකම සටහන් කර ඇත. | විධිමත් පරිදි පොත්පත් පවත්වාගෙන යායුතුය. |
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.116,254,529 ක් වූ කාර්ය මණ්ඩලය ණය හා අත්තිකාරම් ශේෂය ලැබිය යුතු දෑ ලෙස දැක්විය යුතු වුවද මූල්‍ය ප්‍රකාශන වල ණයගැතියන් ලෙස දක්වා තිබුණි. තවද, එක් එක් සේවකයා වෙත ලබාදුන් මුළු ණය මුදල, වර්ෂය අවසන් දිනට හිඟ ණය ප්‍රමාණය ආදිය ඇතුලත් විධිමත් උපලේඛණයක්ද නඩත්තු කර නොතිබුණි. | එකී ණය හා අත්තිකාරම් ඉදිරියේ දී ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කිරීමට සටහන් කර ගතිමි. මේ සඳහා පාලන ගිණුමක් හා එක් එක් සේවකයාගේ නමින් උපලේඛණ පවත්වාගෙන යනු ලැබේ. සේවක පුද්ගලික වැටුප් වාර්ථාවෙහිද ණය විස්තර ඇතුළත් වේ. | කාර්ය මණ්ඩලය වෙත ලබාදී ඇති ණය හා අත්තිකාරම් වෙන්ව ගිණුම් වාර්තා වලට සටහන් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඌ) | විශ්වවිද්‍යාල රෝහල සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන ඖෂධ ලැබීම් සහ නිකුත් කිරීම් සම්බන්ධව විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර නොමැති බව නිරීක්ෂණය විය.<br>මෙම ඖෂධ නොමිලේ ප්‍රතිකාර ලබාගැනීම සඳහා පැමිණෙන රෝගීන් මෙන්ම මුදල් මුදල් ගෙවා ඖෂධ ලබාගැනීමට පැමිණෙන රෝගීන් සඳහාද නිකුත්කර තිබුණු අතර කුමන රෝගීන් කාණ්ඩයක් සඳහා කොපමණ ප්‍රමාණයක් නිකුත්කර ඇද්ද යන්න වෙන් වෙන්ව තොරතුරු ලබාගතහැකි වන පරිදි තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. | මෙම සැපයුම් සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් කළමණාකරන තොරතුරු පරිගණක පද්ධතිය (MSMIS) යම් සීමා කිරීම් සහිතව රෝහල තුළ ස්ථාපිතකර ඇත. එබැවින් අභ්‍යන්තර පාලනයේ යම් යම් දුර්වලතා හඳුනාගෙන ඇත.<br>විශ්වවිද්‍යාල රෝහල වෙත රෝහල් තොරතුරු කළමණාකරන පරිගණක පද්ධතිය (HIMS) මිලදී ගැනීම යෝජිත අතර ඉදිරි මාස කිහිපය තුළ ඖෂධ තොග සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ හැක.<br>නොමිලේ ඖෂධ නිකුත් කිරීම් හා මුදල් ගෙවා ප්‍රතිකාර ගනු ලබන රෝගීන් සඳහා නිකුත් කරනු ලබන ඖෂධ සම්බන්ධව වෙනම වාර්තා නඩත්තු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. අභ්‍යන්තර පාලන පද්ධතියේ ශක්තිමත් ක්‍රියාකාරිත්වය වෙනුවෙන් ස්ථාවර නියෝග ද නිකුත්කර ඇත. | ඖෂධ මිල කර ගාස්තු අයකිරීමට හා පිරිවැය හඳුනා ගැනීමට හැකිවන පරිදි විධිමත් පාලන වාර්තා නඩත්තු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | විශ්ව විද්‍යාලයීය රෝහලේ 2020 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා පරීක්ෂාවේදී රසායනික ද්‍රව්‍ය, ප්‍රතික්‍රියාකාරක තොග නිකුත් කිරීමේදී නිසි ලෙස තොගයට සටහන් නොකිරීම, තොග පොත් යාවත්කාලීන නොකිරීම, තොග පරිගණකගත නොකිරීම ආදී තොග පාලන දුර්වලතාවයන් පැවතුණි. | විශ්වවිද්‍යාල රෝහලේ යෝජිත රෝහල් තොරතුරු කළමණාකරණ පරිගණක පද්ධතිය(HIMS) ස්ථාපනය කිරීමෙන් පසු මෙම දුර්වලතා මගහරවා ගැනිමට හැකිවන බව දන්වා සිටිනු ලැබේ. | තොග පාලනය යාවත්කාලීනව හා නිවැරදිව සිදුකිරීමට අවශ්‍ය පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. |
| (ඒ) | රෝහලේ වෛද්‍ය උපකරණ තොග ලැබීම් සහ නිකුත්කිරීම් පිළිබඳ ලෙජරයේ සඳහන් තොග ශේෂය සහ ගබඩාවේ පැවති තත්‍ය තොග ශේෂය අතර වෙනස්කම් පැවති අවස්ථා නිරීක්ෂණය වූ අතර තොග පොත් යාවත්කාලීන කර පවත්වාගෙන නොමැති බව නිරීක්ෂණය විය | වෛද්‍ය උපකරණ ගබඩාවේ පරිගණකගත ලෙජරයේ තොග ශේෂ යාවත්කාලීනකර නිවැරදිව පවත්වාගෙන යනු ලැබේ. නමුත් තොග පොතෙහි ඇතැම් නිකුත් කිරීම් ඇතුළත් වී නොමැත. වසංගත රෝග තත්වය හේතුවෙන් කාර්යය මණ්ඩලය ඒ සඳහා යෙදවීමට සිදු වීම මෙයට හේතුවිය. මේ වන විට තොග පොත්වල යාවත්කාලින කර ඇත. | තොග පොත් යාවත්කාලීනව පවත්වාගත යුතු අතර අදාල තොග ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරුකර ගැනීමට අවශ්‍ය සැසඳීම් කළ යුතුය. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට විශ්ව විද්‍යාලයේ හා අනුබද්ධ ආයතන වල සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු. 471,600,374 ක් වූ වත්කම් දැනටමත් භාවිතා කරමින් පැවතියද එම වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි සඳහන් නියමයන්ට අනුව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. එමෙන්ම මෙම වත්කම් වල ඵලදායී ජීවිත කාලය සම්බන්ධව කර තිබුණු ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතුකර නොතිබුණි. | විශ්වවිද්‍යාලය සතු දේපළ පිරියත හා උපකරණ වත්කම් ඉදිරි වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර වෙළඳපල වටිනාකමට ගිණුම්ගත කිරීමට හා ඒ වෙනුවෙන් අනුගමනය කල යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සැලසුම් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හා 07 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂයකර ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන වත්කම් සම්බන්ධව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්ව විද්‍යාලයේ ගිණුම් අනුව, රු. 321,919,644 ක් වූ සංචිත 21 ක් ස්කන්ධයට ඇතුළත් කර තිබුණද, රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 98 (ආ) ඡේදය ප්‍රකාරව එම එක් එක් සංචිතයේ ස්වභාවය හා සංචිත පවත්වාගෙන යාමේ අරමුණු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව සංචිත වලට අදාල විස්තර මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කිසියම් දේපලක සාධාරණ අගය විශ්වාසදායී ලෙස මැනිය හැකිවිට, එහි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන දැක්වියයුතු වුවද විශ්ව විද්‍යාලය වෙත 1980 වර්ෂයේදී පවරාදී තිබුණු අක්කර 48 ක භූමිය සහ අනෙකුත් වත්කම් පවරාගත් අවස්ථාවේ පැවති රු. 73,653,874 ක අගය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එබැවින් එම වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්නුම් නොකෙරුණි. | අදහස් දක්වා නොතිබුණි. | වත්කම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්ව විද්‍යාලයීය රෝහල සඳහා සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයන් වලදී මිලදීගෙන තිබුණු හා භාවිතයට ගන්නා එකතු වටිනාකම රු. 283,815,053 ක වෛද්‍ය උපකරණ, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ඉදිරියට කල ගෙවීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. මෙම නිසා ස්ථාවර වත්කම් ඉහත ප්‍රමාණයෙන් හා වර්ෂයේ ක්ෂය වියදම රු. 28,216,753 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.<br>එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතයට ගත් දින සිට ක්ෂය කිරීම ආරම්භ කලයුතු වුවත් මෙකී ස්ථාවර වත්කම් ක්ෂය නොකිරීම නිසා වත්කම්වල සමුච්චිත ක්ෂය හා සමුච්චිත | විගණන විමසුම හා එකඟ වෙමි. මෙම මෙම වෛද්‍ය උපකරණ වත්කම් ලෙස සටහන් කර ක්ෂය හඳුනා ගැනීමට සටහන් කර ගතිමි. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඌණතාවය රු. 86,499,999 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | | |
| (ආ) | විශ්ව විද්‍යාලයීය දක්ෂිණ මණ්ඩපය පවත්වාගෙන යනු ලබන හෙක්ටයාර 56.8 ක් වූ ඉඩම 2020 මාර්තු 26 දින සෙවනගල ප්‍රාදේශීය ලේකම් විසින් විශ්ව විද්‍යාලය වෙත පවරාදී තිබුණු නමුත් එම ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කර වෙළඳපල වටිනාකමට වත්කම් ගිණුම්ගත කිරීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. | ඉඩම් වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී විශ්ව විද්‍යාලයට අනුබද්ධිත අංශයක වැඩබලන අධ්‍යක්ෂවරයකුගේ නිර්දේශය මත පරිපාලිත සමාගමක කොටස් මිලට ගැනීම සඳහා රු. 2,000,000 ක් විශ්ව විද්‍යාලය විසින් සමාගමට ගෙවා තිබුණු නමුත් එම මුදලට කොටස් අත්කර ගැනීමට කටයුතු නොකර ඉහත මුදල සමාලෝචිත වර්ෂයේ අයභාර වියදමක් ලෙස ආදායමට ලියාහැර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | මෙම ගෙවීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන ඇත. ඊට අමතරව මෙම මුදල විශ්වවිද්‍යාල ගිණුමෙන් ඉහත කී සමාගමට මාරු කිරීම සඳහා එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ද ලබා දී ඇත. ඒ අනුව මෙම වටිනාකම විශ්වවිද්‍යාල ගිණුමෙහි ආයෝජනයක් ලෙස හඳුනා ගැනිම සඳහා සටහන් කර ගතිමි. | විධිමත් පරිදි අයභාර හා ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය කර ආයෝජනයන් නියමිත පරිදි ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කළ යුතුය. |
| (ඈ) | විශ්ව විද්‍යාලීය රෝහලේ ප්‍රධාන ඖෂධ ගබඩාව හා අනෙකුත් අංශයන්හි 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති රු. 4,730,553 ක්වූ වෛද්‍ය සැපයීම් තොග වර්ෂයේ වියදමක් ලෙස කපාහැර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | වෛද්‍ය සැපයුම් අංශයෙන් නොමිලේ ප්‍රතිකාර සඳහා රෝහල වෙත 2017 වර්ෂයේ සිට ලබාදෙන ඖෂධ සඳහා ගෙවීමක් සිදු කරනු නොලැබීය. එබැවින් එම තොග අවසන් තොගයේද ගිණුම්ගත කර නැත. | වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබෙන ඖෂධ සඳහා ගෙවීමක් නොකළද, එම ඖෂධ වල ඉතිරි තොග තක්සේරු කර ඉතිරි තොග ලෙස හඳුනාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාලයීය රෝහලේ භාවිතය සඳහා රු. 260,501,370 ක ඖෂධ ලබාදී තිබුණු අතර එම ඖෂධ සඳහා එම දෙපාර්තමේන්තුවට ගෙවීම් කළ යුතු වුවද එම ගෙවිය යුතු මුදල වගකීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එසේම මෙම ඖෂධ වලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති රු. 50,131,260 ක් වූ ඖෂධ තොගය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් අනුගමණය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිද මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි. | වෛද්‍ය සැපයුම් ඒකකය වෙතින් නොමිලේ ප්‍රතිකාර වෙනුවෙන් නිකුත් කිරිම සඳහා රෝහල වෙත 2017 වර්ෂයේ සිට නොමිලේ ලබාදෙන ලද ඖෂධ සඳහා ගෙවීමක් සිදු කරනු නොලැබීය. එබැවින් එම තොග අවසන් තොගයේද ගිණුම්ගත කිරිමක් සිදු නොකරන ලදී. | ඖෂධ වල ඉතිරි තොගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | විශ්ව විද්‍යාලය සතු භෞතික හා මානව සම්පත් භාවිතා කරමින් විශ්ව විද්‍යාලය තුළ පවත්වාගෙන යනු ලබන සමාජ ශාලාව, බේකරිය, ජන අවන්හල සහ ආපනශාලාව යන ඒකක වලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,129,740 ක ලාභයක් උපයා තිබුණු නමුත් එය විශ්ව විද්‍යාලයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ආදායම විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගන්නා අතර එම ඒකක විශ්වවිද්‍යාලයේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබයි. එහෙත් මෙම ආදායමෙන් 20% ක කොටසක් ස්වයං මූල්‍ය අරමුදලට ලබා දිමට විගණන හා කළමනාකරණ කමිටුව නිර්දේශ කර ඇත .ඒ අනුව 2021 වසරේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. | විශ්ව විද්‍යාලයට අයත් වත්කම් වලින් උපයනු ලබන ආදායම් විශ්ව විද්‍යාලයේ ආදායම් ලෙස සැලකිය යුතුය. අත්හරිනු ලබන ආදායම් සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | විශ්ව විද්‍යාලය - ස්පෘෂය වත්කම් | 3,045,470,437 | 2,968,855,743 | 76,613,694 | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල ගිණුම් ශේෂයන් වල සැසඳීම් සිදුකිරීමටත්, වෙනස්කම් තිබේනම් ඊට අදාල හේතු හඳුනාගෙන වෙනස්කම් නිවැරදි කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්වයං මූල්‍ය අරමුදල - ස්පෘෂය වත්කම් | 1,886,514,364 | 8,877,634,085 | 8,880,278 | | |
| (ඇ) | දක්ෂිණ මණ්ඩපය - ස්පෘෂය වත්කම් | 1,093,666,552 | 1,080,532,089 | 2,209,359 | | |
| (ඈ) | විශ්ව විද්‍යාල රෝහල - ස්පෘෂය වත්කම් | 35,717,607,135 | 35,717,809,711 | 202,576 | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ'නල් සටහන් මගින් ගිණුම්වල ගැලපීම් සිදු කිරීමේදී ඒ සඳහා වගකිව යුතු නිලධාරියෙකු විසින් අනුමැතිය ලබා දිය යුතු වුවත් පශ්චාත් උපාධි අධ්‍යයන අංශයෙහි එකතුව රු.402,500 ක් වූ එවැනි ගැලපීම් සඳහා එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අතපසු වීමකින් වගකිවයුතු නිළධාරියා විසින් අත්සන යොදා නොමැති අතර එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිසි අනුමැතිය සහිතව ජ'නල් සටහන් මගින් සිදු කරනු ලබන ගිණුම් ගැලපීම් සිදුකළ යුතුය. |

### 1.5.6 ඒකාබද්ධ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්ව විද්‍යාලය විසින් 2014 වර්ෂයේදී පරිපාලිත සමාගමක් සංස්ථාපනය කර තිබුණු අතර එම සමාගමේ රු.100 සාමාන්‍ය කොටස් 100 හි සම්පූර්ණ අයිතිය විශ්ව විද්‍යාලය සතුව පැවතුණි. එසේ වුවත් මෙම ආයෝජනය පිළිබද මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. එසේම මෙම පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කිරීමට හෝ එසේ ඒකාබද්ධ කිරීමට තාක්ෂණික ගැටළු තිබේනම් ඒ පිළිබඳව හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | විගණන විමසුම හා එකඟ වෙමි. විශ්ව විද්‍යාලය යටතේ 100% අයිතිය ඇති පරිපාලිත සමාගම සම්බන්ධව ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. | ගිණුම් ප්‍රමිති වලට අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරියට කළ ගෙවීම් සහ ලැබිය යුතු වට්නාකම් යටතේ දැක්වෙන රු.11,997,844 ක් වූ (Amount receivable on ration account) වට්නාකම අයකර ගැනීම සඳහා විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණු අතර මෙම වට්නාකම ලැබිය යුත්තේ කාගෙන්ද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට තොරතුරු ඉදිරිපත් නොවුණි. | ශ්‍රී ලංකා නාවික හා ගුවන් හමුදා වෙතින් සලාක මුදල් ප්‍රමාද වීම මෙම ලැබිය යුතු වට්නාකමට හේතුවී ඇත. මෙම වට්නාකම් නිශ්චිතව හදුනාගත හැකි පරිදි විශ්ව විද්‍යාලයේ සැපයුම් අංශයේ ලේඛණ නඩත්තු කරනු ලබන බව දන්වා සිටිමි. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 ඡේදය ප්‍රකාරව යම් පරිපාලිත/ආශ්‍රිත හෝ වෙනත් අස්ථිත්වයක අරමුදල් ආයෝජනය කිරීම, මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය මත සිදු කළයුතු වුවත් එවැනි එකඟතාවකින් තොරවව විශ්ව විද්‍යාලයේ පරිපාලිත සමාගමේ කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් රු. 2,000,000 ක් ලබාදී තිබුණි. | මේ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන ඇත. ඊට අමතරව මෙම මුදල විශ්වවිද්‍යාල ගිණුමෙන් ඉහත කී සමාගමට මාරු කිරීම සඳහා එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ද ලබා දී ඇත. | ආයෝජන සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය මත කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අටවන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝගය. | ශිෂ්‍යයන් බඳවාගැනිම සහ පාලක මණ්ඩලයේ තීරණ වලංගුතාවය යන කරුණු ආවරණය වන ලෙස විශ්ව විද්‍යාලයට ගැලපෙන ලෙස ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල පනත සංශෝධනය කරගන්නා ලෙස දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදීද පනත සංශෝධනය කර නොතිබුණි. | දැනට පවතින පනතේ ඇති පරමාර්ථ පුළුල් කිරීම හා නව උපාධි පාඨමලා ඇති කිරීම කාලින අවශ්‍යතාවයක් බැවින් ඒ සඳහා විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා දි ඇත.<br>නව නිතිමය ප්‍රතිපාදන සැලසිම සඳහා නව පනත් කෙටුම්පතට විශ්වවිද්‍යාල කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය හා<br>අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලද අතර කෙටුම්පත 2016. 12. 06 වන දින නිතිපති වරයා වෙත ඉදිරිපත් කරන ලදි.<br>2020. 12. 14 වන දින මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබු අතර ඉදිරි කටයුතු සිදුකිරිම සඳහා මේ වන විට පාර්ලිමේන්තුව වෙත යොමුකර ඇත. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත සහ 1988 අංක 27 හා 2007 අංක 50 දරන සංශෝධන පනත් | පූර්වෝක්ත පනතේ දැක්වෙන විශ්ව විද්‍යාලය පිහිටුවීමේ පරමාර්ථ අනුව කැඩෙට් නිළධරයන්, නිලධරයන් සහ රජයේ නිලධරයන් සඳහා රාජ්‍ය ආරක්ෂාව සහ යුධ හමුදා කළමනාකරණය සඳහා අදාල වන අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සහ උපදෙස් සැපයීම වුවද 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිළධරයන් නොවන දේශීය හා විදේශීය සිසුන් වෙත මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීම ආරම්භකර තිබුණු අතර 2019/ 2020 අධ්‍යයන වර්ෂය සඳහා එවැනි සිසුන් 786 ක් සඳහා උපාධි පාඨමාලා 21 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | නව සංශෝධිත පනත් කෙටුම්පත 2020. 12. 14 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කිරිමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබු අතර ඉදිරි කටයුතු සිදුකිරිම සඳහා මේ වන විට පාර්ලිමේන්තුව වෙත යොමුකර ඇත. | මෙකී කාර්යයන් සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන සලසා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුම් 05 ක එකතුව රු. 3,065,576,646 ක තැන්පතු ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර මෙම මුදල සාපේක්ෂව ඉහල පොලී අනුපාතයක් යටතේ වෙනත් සුදුසු අයෝජනයකට යොමුකිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමෙහි දක්වා ඇති එකතුව රු.3,065,576,646/- ක තැන්පතු ශේෂයෙන් වැඩිම වටිනාකම වන රු.2,758,077,817/- ක් දැක්වෙන්නේ ලංකා බැංකුවේ පවත්වාගෙන යන ඇමරිකන් ඩොලර් ගිණුමෙහිය. විශ්වවිද්‍යාල රෝහලට අවශ්‍ය කරන වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් ණය මුදලේ ශේෂය ප්‍රධාන වශයෙන් මෙහි දැක්වේ. එසේ ලද ණය මුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 20 ක අතිරික්ත අරමුදල් දැනටමත් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇති අතර ඉතිරි ශේෂය වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වන ණයවර ලිපි සඳහා ගෙවීම් කිරීමට ඉතුරුම් ගිණුමේ පවත්වා ගෙන යනු ලැබේ.රු.292,395,318/- ලෙස දැක්වෙන මහජන බැංකුවේ අංක 080 200 1100 20 111 දරණ බැංකු ගිණුම ඉහල පොළී ආදායමක් ලබා ගැනීමේ අරමුණින් මනි මාර්කට් ගිණුමක් (Money Market Account) ලෙස පවත්වා ගෙන යනු ලබන අතර එම ගිණුමේ ශේෂයද විශ්වවිද්‍යාලට අවශ්‍ය ප්‍රාග්ධන හා අයභාර වියදම් දැරීම සඳහා පවතින ශේෂයක් වේ. | ඵලදායී ලෙස අරමුදල් කළමනාකරණය කළයුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විශ්ව විද්‍යාලය සහ ඊට අනුබද්ධිත ආයතන විසින් පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුම් 8 ක සමාලෝචිත වර්ෂය තුල පවත්වාගෙන ගොස් තිබූ සාමාන්‍ය මාසික අතිරික්ත මුදල් ශේෂය රු.මිලියන 118 ත් රු.මිලියන 534 ත් අතර ප්‍රමාණයක විය. එසේ වුවත් මෙකී අතිරික්ත මුදල් ඇස්තමේන්තු කර උචිත ආයෝජනවල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ දී බැංකු ගිණුම් දෙකක අරමුදල් වලින් කෙටි කාලීන ආයෝජන (REPO) වල ආයෝජන කරන ලද අතර මාර්තු මාසයෙන් පසු ඔක්තෝම්බර් දක්වා ප්‍රමාණවත් අතිරික්ත ශේෂයක් තිබී නොමැත. ආයතනයේ මෙහෙයුම් කටයුතු සහ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වන ගෙවීම් සඳහා අරමුදල් පවත්වාගෙන ඇති අතර හැකි සෑම විටම කෙටි කාලීන අරමුදල් වල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. උපයා ඇති ආදායම රු. මිලියන 4.85 ක් වේ. | ඵලදායී ලෙස අරමුදල් කළමනාකරණය කළයුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 508,518,953 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 413,067,394 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 95,451,559 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කාර්ය මණ්ඩල ගෙවීම් ,සැපයුම් හා සේවා වියදම්, නඩත්තු වියදම් සහ ණය පොලී යන ආදි වියදම් කාණ්ඩවල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

-----------------------------------------------------------------------

(අ) 2019 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු ආදායමෙහි සියයට 10.3 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනය සඳහා භාණ්ඩාගාර ප්‍රදාන රු. මිලියන 641.63 කින් වැඩිවීම හා රෝහල් අදායම් රු. මිලියන 123.9 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු. මිලියන 9,427.42 වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එම වියදම සියයට 10.96 කින් හෙවත් රු. මිලියන 931.05 කින් වර්ධනයවී පැවතුණි. මෙම වර්ධනය සඳහා මූල්‍ය වියදම්, පුද්ගල පඩිනඩි හා සැපයුම් හා සේවා යන වියදම් කාණ්ඩයන්හි සිදුවූ වැඩිවීම් ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) තවද, සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ සමස්ථ වියදමෙන් සියයට 52 ක් හෙවත් රු. මිලියන 4,926 ක් ණය පිරිවැය වෙනුවෙන් දරා තිබුණු අතර එය විශ්ව විද්‍යාලයේ මුළු ආදායමින් සියයට 55 ක් වී තිබුණි. මෙම ණය පිරිවැය විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහල ඉදිකිරීම හා උපකරණ මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකර මත ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගෙන තිබූ එක්සත් ජනපද ඩොලර් මිලියන 201.629 ක ණය මුදල හේතුවෙන් ඇති වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

------------------------

(අ) 2019 වර්ෂයේ දී සෘණ 4.47 ව පැවති ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සෘණ 5.86 දක්වා තවදුරටත් පිරිහෙමින් පැවතුණි.

(ආ) 2019 වර්ෂයේ දී 2.40 : 1 ව පැවති ජංගම වත්කම් වලට ජංගම වගකීම් අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 1.52 : 1 දක්වා අඩුවී පැවතුණි.

(ඇ) 2019 වර්ෂයේ දී ස්කන්ධ ප්‍රාග්ධනය මත ණය ප්‍රාග්ධන අනුපාතය 3.83 : 1 ක්වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම අධිතෝලන තත්ත්වය 4.47 : 1 දක්වා වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වේරහැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අක්කර 48 රූඩ් 02 පර්චස් 16.2 ක් වූ භූමියේ විශ්ව විද්‍යාලයීය ශික්ෂණ රෝහල සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථාන වෛද්‍ය බලකාය ස්ථාපිත කර තිබූ අතර එම ඉඩම ආරක්ෂක අමාත්‍යංශය වෙත අත්පත් කරගැනීම සඳහා රු. 5,054,000,000 ක අතිරේක ප්‍රතිපාදන සලසා දීමට 2017 අප්‍රේල් 25 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. එසේ වුවත් එම තීරණයෙන් වර්ෂ 04 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම අත්පත් කර ගැනීමේ ඉදිරි කාර්යයන් අවසන් කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රෝහල ඉදිකර තිබූ භූමියේ අයිතිය විශ්ව විද්‍යාලය වෙත පැවරී නොතිබුණි. එබැවින් ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලද පෙන්නුම් නොකෙරුණි. | මෙම ඉඩම පවරා ගැනිමේ වගකිම පැවරී ඇත්තේ ආරක්ෂක අමාත්‍යශංය වෙතය. ඒම කටයුතු ආරක්ෂක අමාත්‍යංශය විසින් සිදු කරමින් පවතී. විශ්ව විද්‍යාලය විසින් අදාල තොරතුරු ආරක්ෂක අමාත්‍යංශය වෙත ලබා දී ඇත. | අමාත්‍යංශය මගින් ඉඩම පවරා ගැනිම සදහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මෙම භූමියේ නීත්‍යානුකූල අයිතිය විශ්ව විද්‍යාලය වෙත පැවරී නොමැති වුවත් වර්ෂය අවසන් වන විට එහි ඉදිකර තිබූ ශික්ෂණ රෝහලට අයත් ගොඩනැගිලි වල වටිනාකම රු. බිලියන 31.1 ක් විය. තවද රෝහල ඉදිකිරීම් කටයුතු සඳහා භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. මිලියන 1,217 ක පිරිවැයක් දරා තිබුණි. | ගොඩනැගිලි සහ ඉඩම් සංවර්ධනය සඳහා දරන ලද පිරිවැය ඒවායේ හුදු නෛතික ස්වරූපය අනුව නොව ඒවායේ නියම ආර්ථික ස්වභාවය අනුව වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත. | වත්කම්වල අයිතිය නිරවුල් කර ගැනිම කළමනාකරණයේ වගකීමක් බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල ඉදිකිරීම හා උපකරණ මිලදීගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකර මත 2013 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු. මිලියන 3,165.82 ක ණය මුදලක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 177.33 ක ණය මුදලක් ලබාගෙන | අදහස් දක්වා නොතිබුණි. | විධිමත් ණය කළමනාකරණ ක්‍රමවේදයන්ට අනුව කටයුතු කර ණය ගැනුම් පිරිවැය අවමකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. මෙම එක්සත් ජනපද ඩොලර් ණය මුදලේ අවසන් වාරිකය 2017 ජනවාරි 10 දින ලබාගෙන තිබූ අතර ඉන් එක්සත් ජනපද ඩොලර් 26,229,586 ක් සමාලෝචිත වර්ෂය වන විටත් නිශ්චිත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණු අතර එක්සත් ජනපද ඩොලර් 20,911,260 ක් (රු.මිලියන 3,903.08) ස්ථාවර තැන්පතු ගිණුම් 03 ක ද, එක්සත් ජනපද ඩොලර් 6,229,586 ක් (රු.මිලියන 1,162.75) ඉතුරුම් තැන්පතු ගිණුමකද සියයට 01.02 සිට සියයට 5.5 ක් වූ වාර්ෂික පොලී අනුපාතයන් යටතේ ආයෝජනය කර තිබුණි. | | |
| (ආ) | මෙම ණය මුදලේ වාර්ෂික පොලී ගෙවීම සඳහා වාර්ෂිකව සියයට 15 ක් හා සියයට 8.5 ක් බැගින් භාණ්ඩාගාර ප්‍රතිපාදන සලසා තිබියදී එක්සත් ජනපද ඩොලර් මිලියන 26.22 ක මුදලක් නිශ්චිත කාර්යය සඳහා උපයෝජනය නොකර තිබීමෙන් වාර්ෂිකව එක්සත් ජනපද ඩොලර් මිලියන 2.23 කට (රු. මිලියන 410.498) ආසන්න අතිරික්ත පොලී මුදලක් භාණ්ඩාගාරයට දැරීමට සිදුව තිබුණි. මේ අනුව උපකරණ මිලදී ගතයුතු අවස්ථාව අනුව මෙම ණය මුදල ලබාගැනීමට කටයුතු කලේනම් ඒකාබද්ධ අරමුදලින් ගෙවන අතිරේක පොලී මුදල අවමකරගත හැකිව තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විධිමත් ණය කළමනාකරණ ක්‍රමවේදයන්ට අනුව කටයුතු කර ණය ගැනුම් පිරිවැය අවමකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2017 දෙසැම්බර් මාසයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණු විශ්ව විද්‍යාල රෝහල තුළ ඇඳන් 496 ක් ස්ථාපිතව පැවති අතර විගණනයට ඉදිරිපත්කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ රෝගීන් 16,255 ක් නේවාසික ප්‍රතිකාර ලබාගෙන තිබුණි. ඒ අනුව රෝහලේ ඇඳ පිරිවැටුම් අනුපාතය (Bed Turnover Rate) සියයට 45.12 ක ප්‍රතිශතයක පැවති බැවින් රෝහල් ඇඳන් උපයෝජනයේ ඵලදායීතාව (Productivity of Hospital Beds) අඩු මට්ටමක පැවතුණි. | සමාලෝචිත වර්ෂය තුල රෝගීන් ඇතුලත් කර ගැනිම අඩු මට්ටමක පැවතිමට වසංගත තත්වය හා ඇදිරි නීතිය ක්‍රියාත්මකවීම හේතුවිය. රෝගීන් රෝහලට පැමිණිම හා ඇතුලත් කර ගැනිම අත්‍යාවශ්‍ය ප්‍රතිකාර සඳහා පමණක් සිමා කෙරුණි. තවද හදිසි අනතුරු අංශය රෝහල් ක්‍රියාත්මක නොවිම රෝගීන් ඇතුලත්විම අඩුවිම කෙරේ බලපා ඇත. | ආයෝජිත රාජ්‍ය අරමුදල් සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | තවද 2017 දෙසැම්බර් මාසයේදී රෝහලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණු නමුත් රෝහල තුල ස්ථාපිත හදිසි අනතුරු ඒකකය ඇතුළු ඒකක තුනක් හා වාට්ටු තුනක්, ප්‍රමාණවත් වෛද්‍ය සහ වෙනත් කාර්ය | මෙම ඒකක ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් වෛද්‍ය කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යායුතු අතර එයට සරිලන වාට්ටු හා | ආයෝජිත රාජ්‍ය අරමුදල් සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභ කාලීනව ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩල නොමැති වීම හේතුවෙන් 2021 අප්‍රේල් 28 දින දක්වාත් නිශ්චිත කාර්යය සඳහා යෙදවීමට නොහැකිව තිබුණි. කෙසේ වෙතත් හදිසි අනතුරු ඒකකය හා වාට්ටු දෙකක් පමණක් 2020 අප්‍රේල් මාසයේ සිට කොරෝනා වෛරසය ආසාදිත රෝගීන්ගේ ප්‍රතිකාර කිරීම වෙනුවෙන් භාවිතා කරමින් පැවතුණි. | ශල්‍යාගාර කාර්ය මණ්ඩලයද පරිපූර්ණ විය යුතුය. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර දෙන ඉල්ලීම් කර ඇත. දැනට එම අංශවල ක්‍රියාත්මක වන COVID ආසාදිත රෝගීන් සත්කාර සේවා ඵලදායි ලෙස පවත්වා ගෙන යනු ලැබේ. | |
| (ඉ) | 2018 හා 2019 වර්ෂ වලදී මිලදීගෙන තිබුණු වටිනාකම රු.2,058,138 ක් වූ වෛද්‍ය උපකරණ වර්ග 07 කට අදාල ඒකක 277 ක් භාවිතයට ගැනීමකින් තොරව ගබඩාගතව නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙය ඉදිරියේදි ක්‍රියාත්මක විමට නියමිත අංශ හා දැනට පවතින අංශ වල අවශ්‍යතාවන් සඳහා නිකුත් කිරිමට බලාපොරාත්තු වේ. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනයට ලක්කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | | |
| | කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු 903 ක කාර්ය මණ්ඩලයක් අනුමතකර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට පැවති තත්‍ය කාර්යමණ්ඩලය 767 ක් විය. ඒ අනුව එදිනට තනතුරු 153 ක් පුරප්පාඩුව පැවැතිණි. | අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු අතුරින් බහුතරයක් මහාචාර්ය තනතුරු වන අතර ඒ සඳහා සුදුසුකම් සහිත ප්‍රවිනයන්ගේ ඌනතාවයක් පවති. පුරප්පාඩු සඳහා අවුරුදු පතා පුවත්පත් දැන්වීම් පළ කලද සුදුසුකම් සහිත අයදුම්පත් ලැබීමේ හිඟ කමක් පවතී. දැනට මහාචාර්ය තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත දෙදෙනෙකුත් වැඩ පැවැරුම් පදනම මත 11 දෙනෙකුද අධ්‍යයන කටයුතුවල ගුණාත්වය පවත්වා ගැනීමට යොදවා ඇත.<br>සුළු ශ්‍රේණි හැර අනෙකුත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සඳහා කටයුතු කෙරෙමින් පවතී. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට අමතරව ත්‍රිවිධ හමුදා කාර්ය මණ්ඩලය ලෙස, නිළධාරීන් 103 ක් හා සෙසු නිළයන් 864 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් පූර්ණකාලීන සේවයේ යොදවා ඇති අතර එම කාර්ය මණ්ඩල පාරිශ්‍රමිකයන් ත්‍රිවිධ හමුදා වැය ශීර්ෂ | විශ්ව විද්‍යාලයේ උපදේශක, ඉදිකිරිම් හා ආරක්ෂක රාජකාරි සඳහා නිළධාරින් 11 හා සෙසු නිළයින් 280 තාවකාලික පදනමින් සේවයේ යොදවා ඇති අතර ඔවුන්ගේ රාජකාරි කටයුතු නිමාවීමෙන් පසු නැවත මුදාහරිනු | අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමට කටයුතුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යටතේ දරා තිබුණි.<br>එම කාර්ය මණ්ඩලයට අයත් නිළධාරීන් 92 ක් හා සෙසු නිළයන් 584 දෙනෙකු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගෙන ඇති බව සඳහන් වුවත් එම අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.<br>තවද, ඊට අතිරේකව නිළධාරීන් 11 ක් හා සෙසු නිළයන් 280 ක්ද තාවකාලික පදනමින් සේවයේ යොදවා ඇති බවද නිරීක්ෂණය විය. | ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත අන්තර් රෙජිමේන්තු සේවා (ERE) පදනම මත මෙම මුදාහැරීම් සිදුවන බැවින් ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් අදාල හමුදාවන් මගින් සිදු කෙරේ. | |
| (ඇ) | 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විශ්ව විද්‍යාලයට අනුයුක්ත ත්‍රිවිධ හමුදා කාර්ය මණ්ඩල ප්‍රතිසංස්කරණයක් සිදුකර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සිදුකරන ලෙස නිර්දේශ කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොමැති බවද නිරීක්ෂණය විය. | මෙම විශ්වවිද්‍යාලය වෙත ගැලපෙන අයුරින් නව ත්‍රිවිධ හමුදා තනතුරු ලේඛණයක් සැකසීමේ ඉදිරි කටයුතු සිදුකරමින් පවතින අතර කළමණාකරන සේවා දෙපාර්තමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | දක්ෂිණ මණ්ඩප<br>-------------------- | | |
| | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දක්ෂිණ මණ්ඩපය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය 527 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට පැවති තත්‍ය කාර්යමණ්ඩලය 186 ක් වීමෙන් තනතුරු 341 ක් පුරප්පාඩුව පැවතුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩල අවශ්‍යතාවය හැරුණු කොට අනධ්‍යයන කාර්ය මණ්ඩල අවශ්‍යතාවයද සලකා බලා දැනට දක්ෂිණ මණ්ඩපයේ අධ්‍යයන කටයුතු වල නිරත ශිෂ්‍ය සංඛ්‍යාවට අනුකූලවන පරිදි එම මණ්ඩපයේ දෙපාර්තමේන්තුවල රාජකාරී අවශ්‍යතාවය මත ඇතිවන ඉල්ලීම් පදනම්කරගනිමින් බඳවාගැනීමට කටයුතු කරමින් පවතී. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |